වගා දිරි දීමනා චක්‍රලේඛ අංක - 56

සං / ප්‍රති / 1

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
නො. 70
පාර්ලිමේන්තු පාර
පැලවත්ත
බත්තරමුල්ල.

2001 - 07 - 18

සියලුම ප්‍රාදේශිය කළමනාකාරුවන් වෙත,

## අලුතින් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය
## දිරි දීමනා ( ආධාර මුදල ) වැඩිකිරීම

2001 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි අලුතින් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ ගෙවනු ලබන දිරි දීමනා ( ආධාර ) මුදල හෙක්ටයාරයට රු 36,000 /- සිට හෙක්ටයාරයට රු 50,000 /- දක්වා වැඩිකර ඇත.

01. සංශෝධිත ආධාර මුදල් ගෙවනුලබන ආකාරය පහත දැක්වේ.

| | වාරිකය | 2001.06.30 දින තෙක් ක්‍රියාත්මක වූ ගෙවීම් ක්‍රමය හෙක් / රු. | 2001.07.01 දින සිට ක්‍රියාත්මක වන ගෙවීම් ක්‍රමය හෙක් / රු. |
|---|---|---|---|
| 1 | බිම් සැකසීම | 5000 | 7000 |
| 2 | පස සාරවත් කිරීම | | |
| | i වාරිකය<br>තෘණ සිටුවා මාස 6 කට පසු | 6000 | 4000 |
| | II වාරිකය<br>තෘණ සිටුවා මාස 18 කට පසු | | 4500 |
| 3 | තේ වගාව | 25000 | 34500 |
| | එකතුව | 36,000 | 50,000 |

( ඉහත 2.I වාරිකය ව්‍යාප්ති පරීක්ෂණයක් වන අතර එහි වාර්තාව ගොනුවට ඇතුලත් විය යුතුය )

02. දැනටමත් වලංගු කාලය තුල ක්‍රියාකාරීව පවත්නා සියළුම අවසර පත්‍ර සම්බන්ධයෙන් 2001 ජුලි මස 01 දින හෝ ඉන් පසුව කෙරෙන සියළුම ගෙවීම් 2001.07.01 දින සිට වලංගු ගෙවීම් ප්‍රමානය අනුව ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය. යම් හෙයකින් ඉහත දිනට පසුව මේ දක්වා පැරණි ගෙවීම් ක්‍රමය මත ගෙවා ඇති අවසර පත්‍ර සඳහා එසේ ගෙවූ මුදල සහ නව ගෙවීම් ක්‍රමය අතර ඇති වෙනස ගෙවීමට කටයුතු කරන්න. තව දුරටත් වාරිකයක් ගෙවීමට ඇති අවස්ථා වල මෙම ගෙවීම් ඒ සමඟ එකතුකර ගෙවීමට කටයුතු කළහැකිය.

03. මෙම වාරික ගෙවීම් සංශෝධනය 2001.07.01 දින වනවිට ක්‍රියාකාරීව වලංගු කාලසීමාව තුල පවත්නා සියළුම අවසර පත්‍ර සඳහා බලපැවැත් වෙන බැවින් එකී අවසර පත්‍ර හිමි කරුවන් වෙත නව ගෙවීම් ප්‍රමාණයන් දැනුම් දීමට කටයුතු කරන්න.

අවසර පත්‍රයේ වලංගු කාලසීමාව තුල කටයුතුකර ගෙවීම් ලබා නොගතහොත් නැවත දීර්ඝ කිරීමක් නොකෙරෙන බැව් ඒ සමඟ අවධාරණය කරන්න.

තවද මෙම සංශෝධනය සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ අදාල සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමටද කටයුතු කරන්න.

04. අවසන් වරට අලුතින් තේ වගාව යටතේ ආධාර මුදල් ගෙවීම් සංශෝධනය පිලිබඳව දැනුම් දී ඇති චක්‍රලේඛ හා උපදෙස් වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් මෙම චක්‍රලේඛය පරිදි නැවත සංශෝධනය කරනුලබන බැව් සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියාකරන බවත් නොපමාව මා වෙත වාර්තා කරන්න.

රෝහන ඉලංගරත්න
සභාපති

පිටපත් -

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( සංවර්ධන / ව්‍යාප්ති / මුදල් )
2. සහකාර සාමාන්‍යාධිකාරී ( පරිපාලන / සංවර්ධන )
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමනාකරු
5. පුහුණු කළමනාකරු
6. ගරු සභාපති - සමස්ථ ලංකා කුඩාතේ වතු සංවර්ධන සමිති සංවිධානය
7. සියළුම ප්‍රාදේශීය සංවිධානවල ගරු ලේකම් වරුන්